UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

පළමු වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (බාහිර - නව නිර්දේශය)
2018 අගෝස්තු
FIRST YEAR (100 LEVEL) EXAMINATION IN BACHELOR OF ARTS DEGREE
(EXTERNAL - NEW SYLLABUS) AUGUST 2018

PALE 102: අනිර්දිෂ්ට ග්‍රන්ථ, පාලි ව්‍යාකරණය හා ව්‍යාකරණ ඉතිහාසය

පළමුවන කොටසේ ප්‍රශ්න සියල්ලට ම සහ
දෙවන කොටසේ ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 06 කි.) (කාලය - පැය තුනයි)

---

## පළමුවන කොටස

1. (අ) සිංහලට නගන්න.

එකම්දාහං, ආනන්ද, සමයං උරුවෙලායං විහරාමි නජ්ජා නෙරඤ්ජරාය තීරෙ අජපාලනිග්‍රොධෙ පඨමාභිසම්බුද්ධො. අථ ඛො, ආනන්ද, මාරො පාපිමා යෙනාහං තෙනුපසඞ්කමි; උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො, ආනන්ද, මාරො පාපිමා මං එතදවොච – 'පරිනිබ්බාතුදානි, භන්තෙ, භගවා; පරිනිබ්බාතු සුගතො, පරිනිබ්බානකාලොදානි, භන්තෙ, භගවතො'ති. එවං වුත්තෙ අහං, ආනන්ද, මාරං පාපිමන්තං එතදවොචං –

(ලකුණු 10 කි)

(ආ) සිංහලට නගන්න.

මහාමොහතමං හන්ත්වා සත්තානං හදයනිස්සිතං
රවීව ජොතමානො සො ලොකස්ස අනුකම්පකො,
වස්සානි පඤ්චතාලීසං කත්වා සත්තහිතං බහුං
අධුනා අග්ගික්ඛන්ධොව පරිනිබ්බායි සො ජිනො.

එවං පන භගවති පරිනිබ්බුතෙ විස්සකම්මදෙවපුත්තො තථාගතස්ස සරීරප්පමාණං වරදොණිං රතනෙහි මාපෙත්වා විසුද්ධකප්පාසෙහි තථාගතස්ස සරීරං වෙඨෙත්වා රතනදොණියං පක්ඛිපිත්වා ගන්ධතෙලෙහි පූරෙත්වා අපරාය දොණියා පිදහිත්වා සබ්බගන්ධදාරුචිතකං කත්වා යෙභුය්‍යෙන දෙවතායො ලොහිතචන්දනඝටිකායො ආදාය චිතකායං පක්ඛිපිත්වා අග්ගිං ගාහාපෙතුං නාසක්ඛිංසු.

(ලකුණු 10 කි)

අනෙක් පිටුවට ...

2. (අ) සිංහලට නගන්න.

අතීතං නානුසොචන්ති – නප්පජප්පන්ති නාගතං,
පච්චුප්පන්නෙන යාපෙන්ති – තෙන වණ්ණො පසීදති.

අනාගතප්පජප්පාය – අතීතස්සානුසොචනා,
එතෙන බාලා සුස්සන්ති – නළොව හරිතො ලුතොති.

(ලකුණු 10 කි)

(ආ) සිංහලට නගන්න.

එවං ඉමාහි ද්වාසට්ඨියා දිට්ඨීහි සබ්බදිට්ඨීනං සඞ්ගහිතත්තා සබ්බෙසං දිට්ඨිගතිකානං එතස්මිං දෙසනාජාලෙ පරියාපන්නභාවං දස්සෙත්වා ඉදානි අත්තනො කත්ථචි අපරියාපන්නභාවං දස්සෙන්තො – උච්ඡින්නභවනෙත්තිකො, භික්ඛවෙ, තථාගතස්ස කායොති ආදිමාහ. තත්ථ නයන්ති එතායාති නෙත්ති. නයන්තීති ගීවාය බන්ධිත්වා ආකඩ්ඪන්ති, රජ්ජුයා එතං නාමං. ඉධ පන නෙත්තිසදිසතාය භවතණ්හා නෙත්තීති අධිප්පෙතා. සා හි මහාජනං ගීවාය බන්ධිත්වා තං තං භවං නෙති උපනෙතීති භවනෙත්ති.

(ලකුණු 10 කි)

3. (අ) පාලියට නගන්න.

එක් සමයෙක්හි වෛශාලිය සමෘද්ධිමත් ධනයෙන් පිරුණු ජනගහණයෙන් ගැවැසුණු නගරයෙක් විය. එහි වරෙකට රජකම් කරන ක්ෂත්‍රියයෝ සත් දහස් සත් සිය සත් දෙනෙක් වූහ. ඔවුන්ගේ වාසස්ථානය සඳහා එපමණම ප්‍රාසාද හා කූටාගාර වූයේය. විහරණය සඳහා එපමණ ම ආරාම හා පොකුණු ද විය. ඒ නුවර පසු කලෙක්හි ධාන්‍යයෙන් විරලව දුර්භික්ෂයක් ඇතිවිය. සාදුකින් දුප්පත්තු පළමුවෙන් මියගියහ.

(ලකුණු 10 කි)

(ආ) පාලියට නගන්න.

අතීතයෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජුට පුත්තු දෙදෙනෙක් වූහ. හෙතෙම වැඩි මහලු කුමරාට යුවරාජ තනතුර දුන්නේය. කනිටු කුමරාට සෙන්පති තනතුර දුන්නේය. පසු කලෙක බඹදත් රජු කලුරිය කළ කල්හි ඇමතියෝ දෙටු කුමරු අභිෂේක කරවීමට සූදානම් වූහ. ඔහු මට රජකමෙන් පලක් නැතැයි එය ප්‍රතික්ෂේප කළේය.

(ලකුණු 10 කි)

අනෙක් පිටුවට ...

## දෙවන කොටස

4. (අ) පාලි භාෂාවේ ප්‍රභවය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ලකුණු 10 කි)

(ආ) පාලි භාෂාව හැදෑරීමේ දී සාම්ප්‍රදායික ව්‍යාකරණ ග්‍රන්ථවල උපයෝගීතාව පැහැදිලි කරන්න.

(ලකුණු 10 කි)

5. (අ) පුරිස (අකාරාන්ත) හා කඤ්ඤා (ආකාරාන්ත) ශබ්ද සියලු විභක්තීන්හි වරනගන්න.

(ලකුණු 10 කි)

(ආ) √දා (දානෙ) ධාතුව වත්තමාන ආඛ්‍යාතයේ හා √වස (නිවාසෙ) ධාතුව පඤ්චමී ආඛ්‍යාතයේ පරස්සපදයෙහි වරනගන්න.

(ලකුණු 10 කි)

6. (අ) පහත සඳහන් නාමපදවලට ව්‍යාකරණ විස්තර සපයන්න.

i. මනුස්සො
ii. වානරා
iii. අග්ගිනො
iv. ගොණා
v. ගහපතීනං

(ලකුණු 10 කි)

(ආ) පහත සඳහන් ක්‍රියාපදවලට ව්‍යාකරණ විස්තර සපයන්න.

i. වන්දාපෙති
ii. කරොන්ති
iii. දදෙය්‍යුං
iv. ආපජ්ජති
v. ඛමාපෙය්‍ය

(ලකුණු 10 කි)

==========